# ගම්පහ අධ්‍යාපන කලාපය

## 05 ශ්‍රේණිය - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

## කාර්ය පත්‍රිකා අංක 02

**01. නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. ශ්‍රී ලංකාවේ පිහිටි ලෝක උරුමයක් තෝරන්න.

i. ලංකාතිලක විහාරය ii. හෙනරත්ගොඩ රබර් ගස iii. සීගිරිය iv. පුංචි දඹදිව

2. දෙමළ ජන වර්ගයේ කාන්තාවන්ගේ අනන්‍යතාව සහතික කරන ඇඳුම වන්නේ මින් කුමක් ද?

i. බුර්කාව හා පර්දාව ii. සාරිය හා හැට්ටය iii. ඔසරිය iv. බෝරිච්චි අත් හැට්ටය

3. මුස්ලිම් ජන වර්ගයේ කාන්තාවන්ගේ අනන්‍යතාව සහතික කරන ඇඳුම වන්නේ මින් කුමක් ද?

i. ඔසරිය ii. පර්දාව iii. ගවුම iv. සාරිය

4. බර්ගර් ජන වර්ගයේ අනන්‍යතාව සහතික කරන ආහාර වර්ගය වන්නේ මින් කුමක් ද?

i. බත් සමග ව්‍යාංජන ii. තෝසේ සමග සාම්බාරු iii. ලම්ප් රයිස් iv. කුකුල් මස් සමග බිරියානි

5. දළදා පෙරහැර හඳුන්වන වෙනත් නමකි,

i. මිහිඳු පෙරහැර ii. කතරගම පෙරහැර iii. වෙල් පෙරහැර iv. ඇසළ පෙරහැර

6. ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය වන්නේ,

i. නා මල ii. නිල් මානෙල් මල iii. මානෙල් මල iv. ඕලු මල

7. ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යයින්ට සම්පූර්ණයෙන්ම යටත් වූ වර්ෂය කුමක් ද?

i. 1948 ii. 1796 iii. 1815 iv. 1505

8. සියලුම බැතිමතුන් පොදුවේ වන්දනා කිරීමට යන ස්ථානයක් වන්නේ,

i. ජේතවනාරාමය ii. සීගිරිය iii. කතරගම iv. අනුරාධපුරය

9. ''ස්වයංපෝෂිත රටක ඉර හඳ පවතින තෙක් ධර්මය ආරක්ෂා කරමින් මුළු මහත් ජනතාවම වැජඹේවා '' යන සමස්ථ අදහස ඇත්තේ

i. ජාතික කොඩිය ii. ජාතික ගීය iii. රාජ්‍ය ලාංඡනය iv. බෞද්ධ කොඩිය

10. පහත ආයතන අතරින් රාජ්‍ය ආයතනය තෝරන්න,

i. පෞද්ගලික බැංකුව ii. සුපිරි වෙළඳසැල iii. ප්‍රාදේශීය සභාව iv. සම්පත් බැංකුව

11. ආචාර කිරීමේදී දෑත් එක කර ''වනක්කම්'' යන පදය භාවිතා කරන ජන වර්ගය මින් කුමක් ද?

i. සිංහල ii. දෙමළ iii. මුස්ලිම් iv. බර්ගර්

12. අතීතයේ අප රට යටත් කර ගත් විදේශීය ජාතීන් අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

i. ඉංග්‍රීසි, ලන්දේසි, පෘතුග්‍රීසි ii. ලන්දේසි, ඉංග්‍රීසි, පෘතුග්‍රීසි

iii. පෘතුග්‍රීසි, ලන්දේසි, ඉංග්‍රීසි iv. පෘතුග්‍රීසි, ඉංග්‍රීසි,ලන්දේසි

13. 1818 වසරේ ඌවේ ජනතාව සමග එක්ව ඉංග්‍රීසින්ට එරෙහිව කළ සටනට නායකත්වය දුන්නේ,

i. ගොංගාලේගොඩ බංඩා ii. මොණරවිල කැප්පෙටිපොල දිශාව

iii. මොල්ලිගොඩ දිශාව iv. මඩුගල්ලේ දිශාව

14. ජාතික හැඳුනුම්පත සකස් කිරීම සඳහා තොරතුරු ලබාදෙන අය වන්නේ මින් කවුරුන් ද?

i. සමෘද්ධි නියාමක ii. ගොවි නියාමක iii. ග්‍රාම නිළධාරි iv. ප්‍රාදේශීය සභා සභාපති

15. ගොංගාලේගොඩ බංඩා යුද්ධාධිකරණයට පැමිණ වූ වසර වන්නේ,

i. 1796 ii. 1815 iii. 1948 iv. 1848

16. ශ්‍රී ලංකාවේ ලී කැටයම් සඳහා ප්‍රසිද්ධ ස්ථානයකි,

i. ගඩලාදෙණිය විහාරය ii. ඇම්බැක්කේ දේවාලය iii. දළදා මාළිගාව iv. තිවංක පිළිම ගෙය

17. වෙස් මුහුණු කලාව හා රූකඩ සඳහා ප්‍රසිද්ධියක් උසුලයි.

i. අම්බලංතොට ii. ඇම්බැක්කේ iii. අම්බලංගොඩ iv. මොරටුව

18. ගම් ප්‍රදේශය නියෝජනය කරන රාජ්‍ය නිලධාරියෙක් නොවන්නේ,

i. ග්‍රාමනිලධාරි ii. පවුල් සෞඛ්‍ය සේවිකාව iii. සමෘද්ධි නිලධාරි iv. බැංකු කළමණාකරු

19. දේශීය කලාව හා සංස්කෘතික උරුමයන් ක්‍රමයෙන් අභාවයට යාමට හේතුවක් නොවන්නේ,

i. වටිනාකම හඳුනා නොගැනීම ii. නොසලකා හැරීම

iii. අගය නොකිරීම iv. ආවේණික වටිනාකම් තිබීම

ගම්පහ අධ්‍යාපන කලාපය

20. ප්‍රාදේශිය සභාවෙන් ඉටුවන සේවාවක් නොවන්නේ,

i. ප්‍රදේශයේ කැලි කසල කළමණාකරණය
ii. උප්පැන්න මරණ සහතික ලියාපදිංචිය
iii. වරිපනම් බදු අයකර ගැනීම
iv. මාර්ග සඳහා විදුලි පහන් සවි කිරීම.

(ලකුණු 02 x 20 = 40)

**02. වරහන් තුළින් තෝරා පහත ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න.**

01. කෘෂිකාර්මික කටයුතු වලදී නිරන්තරයෙන් උපදෙස් ලබාදෙයි. ..............................................................
02. ප්‍රදේශයේ අවශ්‍යතා පිළිබඳ කටයුතු කරන මහජන නියෝජිතයා. ..............................................................
03. දාවිත් හෙවත් ඩේවිඩ් , අලුදෙනියේ බණ්ඩා , දොන් පුල්ලේ වෙදරාල. ..............................................................
04. 1948 වසරේ නිදහස ලබාගැනීමට කැප වූ ජන නායකයෙකි. ..............................................................
05. රාජ්‍ය ලාංඡනයේ නිර්මාතෘ ලෙස සැලකේ. ..............................................................
06. ඉස්ලාම් ආගමික උත්සවයකි. ..............................................................
07. කතෝලික බැතිමතුන්ගේ උත්සව අවස්ථාවකි. ..............................................................
08. රාජ්‍ය ලාංඡනයේ වී කරලින් නිරූපණය වේ. ..............................................................
09. ජාතික කොඩියේ රතු පැහැති පසුබිමෙන් නිරූපණය වේ. ..............................................................
10. ජාතික කොඩියේ බෝකොළ සතරින් නිරූපණය වේ. ..............................................................

**(ගොංගාලේගොඩ බංඩා, S.M සෙනෙවිරත්න මහතා, කැරොල් ගීත සංදර්ශන, ඩී.එස්. සේනානායක මහතා, සතර බ්‍රහ්ම විහරණ, මිලාද් උත්සවය, , කෘෂි ව්‍යාප්ති නිලධාරි, ප්‍රාදේශිය සභා සභාපති, ස්වයංපෝෂිතබව හා සශ්‍රීකත්වය, ජාතික අභිමානය)**

(ලකුණු 02 x 10 = 20)

**03. හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

01. රාජ්‍ය ලාංඡනයේ ඇති සංකේත ගණන 8 කි. (.........)
02. මිහිදු පෙරහැර බෞද්ධ ආගම මුල් කර ගත් සංස්කෘතික අංගයකි. (.........)
03. තැපැල් කාර්යාලය තුළ මුදල් තැන්පත් කිරීම කළ හැක. (.........)
04. ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ප්‍රධානියා ප්‍රාදේශිය සභා සභාපති තුමාය. (.........)
05. ''නොමදින් විකුම් පාලා''මෙය රබන් පදයක මුල්පෙළ වේ. (.........) (ලකුණු 01 x 5 = 05)

**04. ආයතන ප්‍රධානියාගේ නිල නාමයට ගැළපෙන පිළිතුරු තෝරා යා කරන්න.**

| | | | |
|---|---|---|---|
| 01. | ප්‍රාදේශිය සභාව | A | සාමාන්‍යාධිකාරී |
| 02. | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | B | විදුලි අධිකාරී |
| 03. | විදුලි බල මණ්ඩලය | C | ස්ථානාධිපති |
| 04. | ජලප්‍රවාහන මණ්ඩලය | D | ප්‍රාදේශිය ලේකම් |
| 05. | තැපැල් කාර්යාලය | E | සභාපති |

(ලකුණු 01 x 5 = 05)

**05. කෙටි පිළිතුරු ලියන්න.**

01. බට්ටා පැනීමේ ක්‍රීඩාව හඳුන්වන වෙනත් නමක් ලියන්න. ..............................................................
02. ගොක්කොල සැරසිලි දැවටීම සඳහා ගන්නා ශාකය නම් කරන්න. ..............................................................
03. ශ්‍රී වික්‍රම සර්ව සිද්ධි නමින් රජ වූයේ කවුරුන් ද? ..............................................................
04. පැරණි ගල් කැටයම් සඳහා ප්‍රසිද්ධ පළාත නම් කරන්න. ..............................................................
05. ලංකාවේ පැරණි සටන් කලාව හැඳින්වූ නම ලියන්න. ..............................................................
06. සීගිරි චිත්‍ර ආසන්නයේ දැකිය හැකි අනෙක් වටිනා නිර්මාණය හඳුන්වන නම ලියන්න. ..............................................................
07. දේවස්ථාන මංගල්‍යය පවත්වන්නේ කුමන බැතිමතුන් ද? ..............................................................
08. රාජ්‍ය ලාංඡනයේ සෞභාග්‍ය හා පරිපූර්ණ බව නිරූපණය වන්නේ කුමක් ද? ..............................................................
09. කරඬුව සහිත ඇතා, කස කරුවන් , ගිනි බෝල කරකවන්නන් ආදී දේ සහිත හෙළ සංස්කෘතික අංගය කුමක් ද? ..................
10. යුරෝපීය ඇඳුමට හිමිකම් කියන ජන වර්ගය කුමක් ද? ..............................................................
11. ශ්‍රී ලංකාවේ ලෝක උරුමයක් ලෙස සලකන වනාන්තරය නම් කරන්න. ..............................................................
12. ඔසරිය සහ බෝරිච්චි අත් හැට්ටය අඳින කාන්තාවක් සහිත ජන වර්ගය නම් කරන්න. ..............................................................
13. පරාටා , වටලප්පන් , හරක්මස් , ෆලූඩා වැනි ආහාර පාන තම අනන්‍ය ආහාර ලෙස සලකන ජන වර්ගය නම් කරන්න. ..............................................................
14. ශුද්ධ වූ බයිබලය තම ආගමික ග්‍රන්ථය ලෙස සලකන්නේ කුමන ආගමිකයින් ද? ..............................................................
15. 1815 උඩරට ගිවිසුමේ වගන්ති කියවා අවසන් කිරීමට පෙර එසවූ ඉංග්‍රීසි කොඩිය පහත හෙළා අප ජාතික කොඩිය නැවත එසවූ අභීත හිමි නම නම් කරන්න. .............................................................. (ලකුණු 02 x 15 = 30)

05 ශ්‍රේණිය - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

කාර්ය පත්‍රිකා අංක 01

# පිළිතුරු පත්‍රය

## 01. ප්‍රශ්නය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | 3 | 2. | 3 | 3. | 2 | 4. | 3 | 5. | 4 |
| 6. | 3 | 7. | 3 | 8. | 3 | 9. | 3 | 10. | 3 |
| 11. | 2 | 12. | 3 | 13. | 2 | 14. | 3 | 15. | 4 |
| 16. | 2 | 17. | 3 | 18. | 4 | 19. | 4 | 20. | 3 |

## 02. ප්‍රශ්නය

1. කෘෂි ව්‍යාප්ති නිලධාරී
2. ප්‍රාදේශිය සභා සභාපති
3. ගොංගාලේගොඩ බංඩා
4. ඩී.එස්. සේනානායක මහතා
5. S.M සෙනෙවිරත්න මහතා
6. මිලාද් උත්සවය
7. කැරොල් ගීත සංදර්ශණය
8. ස්වයංපෝෂිත බව හා සශ්‍රීකත්වය
9. ජාතික අභිමානය
10. සතර බ්‍රහ්ම විහරණ

## 03. ප්‍රශ්නය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | × | 2. | ✓ | 3. | ✓ | 4. | × | 5. | × |

## 04. ප්‍රශ්නය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | E | 2. | D | 3. | B | 4. | A | 5. | C |

## 05. ප්‍රශ්නය

1. කොටු පැනීම
2. කෙසෙල් ගස්
3. ගොංගාලේගොඩ බංඩා
4. උතුරුමැද පළාත
5. අංගම්පොර
6. කැටපත් පවුර
7. කතෝලික බැතිමතුන්
8. පුන්කලසින්
9. පෙරහැර
10. බර්ගර් ජනතාව
11. සිංහරාජ වනය
12. සිංහල ජන වර්ගය
13. මුස්ලිම් ජන වර්ගය
14. ක්‍රිස්තියානි ආගමිකයින්
15. වාරියපොළ සුමංගල හිමි